# සාමාන්‍ය සමයේ විසිඅටවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 4 : 1 – 8

"ආබ්‍රහම් දෙවියන් වහන්සේ අදහා ගත් නිසා ඔහු ධර්මිෂ්ඨයෙකු විය."

එසේ නම්, අපේ ජාතියේ පියා වූ ආබ්‍රහම් ගැන අපි කුමක් කියමු ද? ඔහු දේව සබඳතාවට පමුණුවනු ලැබුවේ කෙසේද? ආබ්‍රහම් සිය ක්‍රියා නිසා දේව සබඳතාවට පමුණුවනු ලැබුවේ නම්, පාරට්ටු කර ගැනීමට හේතුවක් ඔහුට ඇත. එහෙත් දෙවියන් වහන්සේ ඉදිරියෙහි එසේ කිරීමට ඉඩක් නැත. ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇති පරිදි, 'ආබ්‍රහම් දෙවියන් වහන්සේ අදහා ගත්තේය. ඒ ඇදහිල්ල නිසා ඔහු ධර්මිෂ්ඨයෙකු බව උන් වහන්සේ පිළිගත් සේක.' යම් වැඩක් කරන කෙනෙකුට දෙන වේතනය පාරිතෝෂික දීමනාවක් හැටියට නොව, ඔහුට ගෙවිය යුක්තක් හැටියට සලකනු ලැබේ. එහෙත් එවැනි යමක් නොකරන අභක්තිකයන් දේව සබඳතාවට පමුණුවන දෙවියන් වහන්සේ අදහන තැනැත්තා ඔහුගේ ඇදහිල්ල නිසා ධර්මිෂ්ඨ ලෙස පිළිගනු ලැබේ. ඒ හැටියට, කෙනෙකුගේ පුණ්‍ය ක්‍රියා ගණන් නොගෙන දෙවියන් වහන්සේ විසින් දේව සබඳතාවට පමුණුවනු ලබන මිනිසාගේ භාග්‍යවන්තකම ගැන දාවිත් රජු මෙසේ කියයි.

"තමන්ගේ අධාර්මික ක්‍රියාවලට කමාවත් පාපවලින් නිදහසත් ලැබූ අය භාග්‍යවන්තයෝ ය. ස්වාමින් වහන්සේ විසින් පාපය ගණන් නොගෙන හරිනු ලබන තැනැත්තා භාග්‍යවන්ත ය."

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **32: 1–2, 5, 11**

පිළිතුර: අපගේ රැකවරණය සමිඳාණෝ ය.

ගීය:

අපරාධයට සමාව ද පාපයට සමාව ද ලත් මිනිසා ආසිරි ලද්දෙකි. වරදක් ගැන සමිඳුන්ගෙන් චෝදනාවක් නොලබන, වංක සිතක් නොමැති මිනිසා ආසිරි ලද්දෙකි.

මාගේ පව් නොසඟවා මම පාපොච්චාරණය කළෙමි. "හිමි තුමන්ට මාගේ පව් කියන්නෙමි"යි කීමි. ඔබ ද මාගේ පාප දෝෂ කමා කළ සේක.

දැමිටුනි, හිමිතුමන් කෙරේ ප්‍රීති වී උදන් අනන්න. අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා පවත්වන්න.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!<br>
සමිඳුන්ගේ අණ පණත් සිතට සතොස වඩන්නේය.<br>
දෙනෙතට එළිය ද දෙන්නේ ය.<br>
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!<br>
සමිඳුනි, ඔබ කෙරෙහි අපේ බලාපොරොත්තු පිට වූ ලෙසම<br>
ඔබේ කරුණාව අප කෙරෙහි වේවා!<br>
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 1–7

"ඔබගේ හිසකෙස් සියල්ල පවා ගණන් කොට ඇත."

ඒ අතරතුරේ දී ඔවුනොවුන් පෑගෙන තරමට දහස් ගාණක් සමූහයක් රැස්ව සිටිය දී උන්වහන්සේ පළමුකොට සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාරන්නට පටන් ගත් සේක. "පරිසිවරුන්ගේ කුහකකම නමැති මුහුන්වලින් පරෙස්සම් වන්න. සැඟවී ඇති සැම දේ ම හෙළි කරනු ලැබේ. සැම රහසක්ම ප්‍රකාශ කරනු ලැබේ. එබැවින් ඔබ අඳුරෙහි පැවැසූ දේ එළියෙහි අසන්නට ලැබේ. ඇතුළු ගබඩා වල දී කණට කොඳුරන ලද දෙය පියසි මුදුනෙන් පළ කරනු ලැබේ." "මාගේ මිත්‍රවරුනි, ශරීරය නසා ඉන්පසු අන් කිසිවක් කළ නොහැකි අයට බිය නොවන්නැ යි මම ඔබට කියමි. එහෙත් ඔබ බිය විය යුත්තේ කවරෙකුට දැ යි මම ඔබට පෙන්වමි. ඔබ නැසුණ පසු නිරයේ හෙළීමට බලය ඇති තැනැත් වහන්සේට බිය වන්න. එසේය, උන්වහන්සේට බිය වන්නැ යි මම ඔබට කියමි."

තුට්ටු දෙකකට ගේ කුරුල්ලන් පස් දෙනෙකු විකුණනවා නොවේ ද? දෙවියන් වහන්සේ උන්ගෙන් එකෙකු වත් අමතක නොකරන සේක. ඔබගේ හිසකෙස් සියල්ල පවා ගණන් කොට ඇත. බිය නොවන්න. ඔබ ගේ කුරුල්ලන් රාශියකට වඩා අගනේ ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.